## ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලශාලා මණ්ඩලය - 2017

----------------------------------------------------------

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩල පනතේ 12 වන වගන්තියේ 3 උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිවිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය ව්‍යාචනය

---------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

---

(i) ප්‍රමිතයේ 38 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් කර නොතිබුණු අතර ප්‍රමිතයේ 132(ඇ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද පදනම හෙළිදරව්කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇතිවිටක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.448,671 ක බැංකු අයිරාව, එදිනට පැවති මුදල් හා මුදල් සමාන දෑවල මුළු වටිනාකම වූ රු.59,215,119 ක ශේෂයෙන්ද රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල රු.27,373,267 ක බැර ශේෂ රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල රු.286,765,620 ක හර ශේෂවලින්ද හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iii) ප්‍රමිතයේ 95 (ඇ) ඡේදය ප්‍රකාරව, ස්කන්ධ ප්‍රාග්ධනය තුළ පවතින එක් එක් සංචිතවල ස්වභාවය හා අරමුණු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට රු.2,280,000 ක් වූ ප්‍රාග්ධන සංචිතය පිළිබඳ විස්තර හෙළිදරව්කර නොතිබුණි.

(iv) ප්‍රමිතයේ 108 ඡේදය ප්‍රකාරව, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මුහුණතෙහි හෝ සටහන් තුළ මුළු අයභාරයේ උපවර්ගීකරණයක් අදාළ අස්ථිත්වයේ මෙහෙයුම්වලට යෝග්‍ය පරිදි වර්ගීකරණයකර ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ රෝගී සත්කාර සේවය වෙනුවෙන් රෝහල වෙත ලැබී තිබුණු රු.2,100,844,980 ක ආදායම වර්ගීකරණයකර ඉදිරිපත්කර නොතිබුණි.

(v) ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ මිනුම්කරණ පදනම් හෙළිදරව් කළ යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට රු.432,718,789 ක් වූ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල මිනුම්කරණ පදනම හෙළිදරව්කර නොතිබුණි.

(vi) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2017 දෙසැම්බර් 31 දිනට වූ රු.359,565,291 ක් වූ ඉතිරි තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කර තිබුණද එම තොග අයිතම පිළිබඳව වෙන වෙනම හෙළිදරව්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

---

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,968,854,481 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින්

පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව, වත්කමක් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු හා එය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාකල හැකි තත්ත්වයෙන් තිබෙන විටදී ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද, ඊට පටහැනිව වත්කම් මිලදී ගන්නා වූ හෝ අත්පත් කර ගන්නා වූ හෝ වර්ෂයේදී ක්ෂය නොකිරීම ගිණුම්කරණ ප්‍රතිපත්තිය බව හෙළිදරව් කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු පාලන ගිණුමේ (Hospital Chrages Control Account) පැවති හඳුනානොගත් රු.16,271,838 ක හර ශේෂය, එය ඇතිවූ ආකාරය සොයා නිවැරදි කිරීමට කටයුතු නොකර රෝහල් නේවාසික ගාස්තු ආදායම් (Accomodation Charges) ගිණුමට මාරුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය සැපයීම් අංශයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පිරිවැය රු.31,444,099 ක් වූ ඖෂධ සහ සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු උපකරණ ඒකක 491 ක වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) පරිගණක පද්ධතියේ පවතින දෝෂයක් හේතුවෙන්, ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය, සැරහුම්, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, විකිරණශීලී ද්‍රව්‍ය, රසායනාගාර ද්‍රව්‍ය, ලිපි ද්‍රව්‍ය හා පොදු ගබඩා ද්‍රව්‍ය සඳහා වූ තොග ගිණුම් 9 ක 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂ වෙනුවට 2016 ජනවාරි 01 දිනට එම ගිණුම්වල පැවති ආරම්භක ශේෂ සටහන්වීමේ වරද නිසා එම තොග ගිණුම්වලට වැඩියෙන් හර කර තිබුණු රු.51,606,864 ක් නිවැරදි කිරීම සඳහා කටයුතු නොකර ඒ වෙනුවට ඊට සමාන වටිනාකමක් එක් එක් තොග ගිණුමෙන් අදාළ ගැණුම් ගිණුම්වලට මාරුකර තිබුණි.

(ඈ) වෛද්‍ය සැපයීම් අංශ වෙනුවෙන් වූ ණයහිමි ගිණුමේ පැවති, එම අංශයෙන් ඉකුත් වර්ෂයේදී සපයාගත් වෛද්‍ය සැපයීම් වෙනුවෙන් ගෙවිය යුතු රු.35,700,014 ක් වෛද්‍ය සැපයීම් ගිණුමෙන් ඉවත් කිරීමෙන් තොරව ජර්නල් සටහන් මගින් නැවත වෙළඳ ණයහිමි පාලන ගිණුමට හර කරමින් වෙනම ණයහිමි පාලන ගිණුමකට (Creditors Control A/C) බැර කර තිබීම හේතුවෙන්, ඊට සමාන අගයකින් ණයහිමි ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ශල්‍යාගාරය සඳහා වෛද්‍ය උපකරණ හා රසායනාගාර සඳහා ලී බඩු මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වත්කමේ වටිනාකමින් කොටසක් ලෙස ගෙවා තිබුණු අත්තිකාරම් රු.23,284,960 ක් අත්තිකාරම් ගිණුමට හර කිරීම වෙනුවට අදාළ වත්කම් ගිණුම්වලට හර කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර වත්කම් අයිතම 2 ක් මිලදී ගැනීම සඳහා වැයකර තිබුණු රු.165,183 ක් අදාළ වත්කම් ගිණුම්වලට හර නොකර විවිධ වියදම් ගිණුමට හර කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 10 කදී වෛද්‍ය උපකරණ සැපයුම්කරුවන් 7 දෙනෙකු වෙත ගෙවීම් කිරීමේදී, ගිවිසුම් ප්‍රකාරව අයකර තිබුණු ප්‍රමාද ගාස්තු රු.2,875,084 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂය තුළදී රෝහලේ අංශ 16 කින් ඉවත්කරන ලද වෛද්‍ය උපකරණ, විදුලි සෝපාන, විදුලි උත්පාදක යන්ත්‍ර, ගොඩනැගිලි ද්‍රව්‍ය, ලී බඩු උපකරණ, රෝද පුටු හා වෙනත් උපකරණ රු.4,391,608 කට විකුණා තිබුණද එම වත්කම්වල පිරිවැය හා සමුච්චිත ක්ෂය හඳුනාගෙන අදාළ ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතුකර නොතිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ගොඩනැගිලි (Other Building) ලෙස හඳුනාගෙන තිබුණු පිරිමි හෙද නේවාසිකාගාරය පිහිටි ගොඩනැගිල්ල සඳහා වූ ක්ෂය ප්‍රතිශතය සියයට 5 ක් වුවද, එය සියයට 2 කින් පමණක් ක්ෂයකර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.283,746 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) ස්ථිර පත්වීම් නොලද සිසු හෙද නිලධාරීන් 50 දෙනෙකුගේ වැටුපෙන් අඩුකර ගෙන තිබුණු සේවක අර්ථසාධක අරමුදල් රු.183,144 ක් ඔවුන් වෙත ආපසු ගෙවා තිබුණු නමුත් එම මුදල වැටුප් ගිණුමට හර නොකර වැටුප් අත්තිකාරම් ගිණුමට හර කර තිබුණි.

(ඔ) ඉකුත් වර්ෂයේ ගොඩනැගිලි හා ලී බඩු උපකරණ ක්ෂය රු.93,756 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීමේ වරද ප්‍රවර්තන වර්ෂයේදී නිවැරදිකර තිබුණු නමුත් ඊට සමාන අගයකින් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම ක්‍රමක්ෂය කර නොතිබුණි.

(ඕ) 2017 දෙසැම්බර් 31 දින වන විට නිරවුල්කර අවසන්ව තිබුණු සේවකයන් දෙදෙනෙකුගේ ආපදා ණය ශේෂ එකතුව රු.211,022 ක් එදින වන විට තවදුරටත් අයවිය යුතු ණය ලෙස දක්වා තිබුණු අතර වෙනත් සේවකයන් දෙදෙනෙකුගෙන් නිරවුල්කර ගෙන නොතිබුණු ආපදා ණය ශේෂ එකතුව රු.245,396 ක් එදිනට අයවිය යුතු ණය ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(ක) කුලියට ලබාදී තිබුණු රෝහල් පරිශ්‍රයේ කොටස් වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු විදුලි ගාස්තු රු.81,848 ක්, එදිනට අයවිය යුතු විකුණුම් කොමිස් රු.146,041ක් හා එදිනට අයවිය යුතු වෙනත් ආදායම් වර්ග 9 ක් වෙනුවෙන් රු.628,460 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ග) 2014 වර්ෂය හා ඊට පෙර වර්ෂවලදී විශ්‍රාම ගිය හා සේවයෙන් ඉවත්ව ගොස් සිටි සේවකයින් තිදෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,004,992 ක් පාරිතෝෂික ප්‍රතිපාදන සලසා තිබුණු අතර සේවයෙන් ඉවත් වූ වෙනත් සේවකයින් 3 දෙනෙකු වෙත 2015 වර්ෂයේදී රු.599,247 ක් පාරිතෝෂික දීමනා ගෙවා තිබුණද එම වටිනාකම තවදුරටත් ගෙවිය යුතු මුදලක් ලෙස දක්වා තිබුණි.

(ජ) සේවකයෙකු වෙත පාරිතෝෂික දීමනා ගෙවීමේදී අයකර ගන්නා ලද ආපදා ණය රු.96,069 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ට) රෝහල් ගාස්තු ණයගැතියන් වූ රක්ෂණ ආයතන හා වෙනත් ආයතනවලින් ලබාදෙන ණය ලිපිය (Credit Letters) තුළ ඇතුළත් වෘත්තීය ගාස්තුව හා රෝහල් ගාස්තුව නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කිරීමෙන් තොරව රු.9,163,244 ක් රෝහල් ගාස්තු පාලන ගිණුමට හර කර වෘත්තීය ගාස්තු ගෙවීම් ගිණුමට බැරකර තිබුණි.

(ඩ) 2017 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව කල් ඉකුත් වූ තොග ඒකක 17,472 ක පිරිවැය රු.6,520,276 ක් ලාභයට එරෙහිව කපාහැරීමට කටයුතු කර නොතිබුණි. තොග ගිණුම් තැබීමට අදාලව භාවිතකරන පරිගණක මෘදුකාංගවලට අනුව, එදිනට කල් ඉකුත් වූ තොග ඒකක 43,385 ක පිරිවැය රු.3,848,630 ක් වූ බැවින් රු.2,671,646 ක වෙනසට හේතු හඳුනාගෙන නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

පහත සඳහන් විෂයයන්වලට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනු හා ලේඛන අනුව වටිනාකම අතර එකතුව රු.261,789,518 ක වෙනසක් පැවති නමුත් වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.

| | විස්තරය | විගණනයට ඉදිරිපත් කළ ගිණුම/ලිපිගොනුව/ලේඛනය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | ගිණුම/ ලිපිගොනුව/ලේඛනය අනුව වටිනාකම | වෙනස |
|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. |
| (i) | 2017 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු ණයගැතියන් | කේවල ණයගැති ශේෂ ලැයිස්තුව | 132,325,102 | 134,958,121 | 2,633,019 |
| (ii) | 2017 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමියෝ | කේවල ණයහිමි ශේෂ ලැයිස්තුව | 477,920,039 | 516,627,485 | 38,707,446 |
| (iii) | 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග | භෞතික තොග සමීක්ෂණ වාර්තා | 364,603,053 | 365,687,748 | 1,084,695 |
| (iv) | 2017 දෙසැම්බර් 31 දිනට කාර්යසාධන ඇප තැන්පත් | උපලේඛනය | 1,463,230 | 1,685,195 | 221,965 |
| (v) | සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගන්නා ලද හා අත්පත් කර ගන්නා ලද ස්ථාවර වත්කම්වල පිරිවැය | (i) පරිගණක මුද්‍රිත උප ලේඛනය | 762,668,493 | 657,759,711 | 104,908,782 |
| | | (ii) භාණ්ඩ ලැබීම් පත්‍රවල (GRN) විස්තර ඇතුළත් උපලේඛනය | 762,668,493 | 648,847,810 | 113,820,683 |
| (vi) | 2017 දෙසැම්බර් 31 දිනට උත්සව අත්තිකාරම් | විස්තරාත්මක උත්සව අත්තිකාරම් වාර්තාව | 488,455 | 302,500 | 185,955 |
| (vii) | ගිලන්රථ ගාස්තු ආදායම | ආදායම් වර්ගීකරණ වාර්තාව, පෞද්ගලිකව ගිලන්රථ වෙන්කර ගැනීමේ ලේඛනය හා පෞද්ගලික වාරිකා ලේඛනය | 2,998,989 | 2,772,016 | 226,973 |

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | විවිධ තැන්පතු | 4,189,582 | වර්ෂ 20 කට වඩා පැරණි විවිධ තැන්පතු ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කරගත හැකි ලේඛන. |
| (ආ) | සේවා ගාස්තු | 511,644 | වෘත්තීය ගාස්තුවලින් සියයට 0.15 ක් පමණක් රෝහල් සේවා ගාස්තු ලෙස අයකර ගැනීමට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය. |
| (ඇ) | 2017 දෙසැම්බර් 31 දිනට ණයගැතියෝ හා<br>ණයහිමියෝ | 128,187,769<br>477,920,038 | හිඟ කාලසීමාව නිසි ලෙස අනාවරණය වන පරිදි පිළියෙල කරන ලද ණයගැති හා ණයහිමි කාල විශ්ලේෂණ. |
| (ඇ) | වෘත්තීය ගාස්තු අයකිරීම් හා ගෙවීම් | 356,017,257<br>289,538,096 | වෘත්තීය ගාස්තු අයකිරීම් හා ගෙවීම් Datamation මෘදුකාංග පද්ධතිය තුළින් සිදුකර තිබුණු නමුත්, අයවිය යුතු වෘත්තීය ගාස්තු, ගෙවිය යුතු වෘත්තීය ගාස්තු හා ගෙවූ වෘත්තීය ගාස්තු පිළිබඳ විස්තර. |
| (ඉ) | රෝහල් ගාස්තු ආදායම්වල වැරදි නිවැරදි කිරීම | 1,010,158,314<br>1,957,650,245 | වැරදි නිවැරදි කිරීමේ ගනුදෙනු දෙක සඳහා විධිමත් අනුමැතියක් සහිත ජර්නල් සටහන්. |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වඩා පැරණි රු.4,572,784 ක් වූ විවිධ ණයහිමි (Sundry Creditors) ශේෂ 15 ක්, රු.800,907 ක් වූ කාර්යසාධන බැඳුම්කර තැන්පතු (Performance Bond Deposit) ශේෂ 7 ක් හා රු.3,616,142 ක් වූ ගෙවිය යුතු වෘත්තීය ගාස්තු, නිරවුල් කිරීමට හෝ ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හෝ කටයුතුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා යුධ හමුදාව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙතින් 2009 වර්ෂයට පෙර සිට අයවිය යුතු රෝහල් ගාස්තු පිළිවෙලින් රු.2,438,514 ක් හා රු.1,698,819 ක් අයකර ගැනීමට හෝ විධිමත් අනුමැතිය ලබා ගෙන ගිණුම්වලින් කපාහැරීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) සීමාවාසික වෛද්‍යවරුන් වෙත 2013 හා 2016 වර්ෂයන්වලදී ගෙවා තිබුණු වැටුප් පිළිවෙලින් රු.1,112,280 ක් හා රු.3,312,066 ක් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගැනීමට 2018 ජුනි 30 දින වන විටත් කටයුතුකර නොතිබුණි.

(ඈ) වෛද්‍ය නිලධාරියෙකු වෙත 2015 වර්ෂයේදී ගෙවන ලද වැටුප් අත්තිකාරම් රු.87,000 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත | පනත ප්‍රකාරව, රු.මිලියන 5 කට වැඩි කොන්ත්‍රාත් සඳහා ඉදිරිපත් වන කොන්ත්‍රාත්කරුවන් විසින් තමාද ඒ පොදු කොන්ත්‍රාත් ගිවිසුමද පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි විය යුතු වුවද, මුළු පිරිවැය රු.175,827,708 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 3 ක් සහ මුළු පිරිවැය රු.58,562,300 ක් වූ වෛද්‍ය උපකරණයක් මිලදී ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත්කරුවන් හා එම කොන්ත්‍රාත් ගිවිසුම් ලියාපදිංචි කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 103 (1) (ආ) හා 104 (1) (අ) | 2016 හා 2017 වර්ෂවලදී සිදු වූ වාහන අනතුරු 8 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චයකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 389 (අ) සහ (ආ) | ආදායකයාගේ අනන්‍යතාවය නිසි පරිදි තහවුරු කරගෙන චෙක්පත් භාරදිය යුතු වුවද, වෛද්‍යවරුන් 58 දෙනෙකු වෙත 2017 ජනවාරි මාසය තුළ වෘත්තීය ගාස්තු ලෙස රු.10,074,565 ක් සඳහා වූ චෙක්පත් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරුකර නොගෙන භාර දී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 756 (1) | එක් එක් අංශයන්හි හා ශාඛාවෙහි ඇති භාණ්ඩ හරි වැරදි බැලීම සඳහාද, භාවිතයට ගත නොහැකි භාණ්ඩ ගැන වාර්තා කිරීම සඳහාද සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දින හෝ ඊට ආසන්නව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සමීක්ෂණ කටයුතු සිදුකළ යුතු වුවද, 2017 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2018 ජුලි 31 දින වන විටත් සිදුකර නොතිබුණි. |
| (ඇ) 2007 මාර්තු 09 දිනැති අංක 133 (1) දරන අයවැය චක්‍රලේඛය හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, සේවකයෙකුට ලබාදිය යුතු උපරිම ආපදා ණය රු.250,000 කට සීමාකර තිබුණද,2017 ජනවාරි සිට 2017 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වන මාස 09 තුළදී සේවකයින් 106 දෙනෙකු වෙත රු.258,114 සිට රු.399,346 ක් දක්වා පරාසයක ආපදා ණය නිකුත් කර තිබුණු අතර උපරිම ණය හිමිකම ඉක්ම වූ මුළු වටිනාකම රු.6,758,503 ක් විය. |

| | | |
|---|---|---|
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | නිල වාහනයක් වෙන්කර ඇති හෝ ඉන්ධන දීමනාව සමග ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරීන් සංචිත වාහන භාවිතා නොකළ යුතු නමුත් රෝහලේ නිලධාරීන් 6 දෙනෙකු විසින් කිලෝ මීටර් 2,191 ක ගමන් යාමට සංචිත වාහන 6 ක් භාවිතාකර තිබුණි. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 භාණ්ඩාගාර චක්‍රලේඛය | අදාල චක්‍රලේඛයට අනුකූල පරිදි ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රෝහල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.149,619,386 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.175,818,975 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.26,199,589 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ රෝහලේ මෙහෙයුම් වියදම් රු.306,785,959 කින් වැඩි වී තිබුණු නමුත් වර්ෂයේ ආදායමද රු.340,926,448 කින් වැඩි වී තිබීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු.92,286,361 ක හා රු.720,613,254 ක අතිරික්තයක් ඇති වී තිබුණු අතර 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පිළිවෙලින් රු.352,618,182 ක, රු.175,818,975 ක හා රු.149,619,386ක ඌනතාවයන් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.1,026,310,304 ක් වූ දායකත්වය විචලනය වෙමින් පැවතියද සමාලෝචිත වර්ෂය වන විට එය රු.1,477,876,821 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙලකර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව, ගෙවන වාට්ටු සංකීර්ණය (Paying Ward Complex), පිරිමි හෙද නේවාසිකාගාරය (Male Nurses Quarters) හා වැඩහල (Workshop) ගොඩනැගිල්ල ඉදිකිරීමට පිළිවෙලින් රු.මිලියන 1300 ක්, රු.මිලියන 68 ක් හා රු.මිලියන 85 ක් වෙන්කර තිබුණද, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම තුළ එම ක්‍රියාකාරකම් සඳහා පිළිවෙලින් රු.මිලියන 750 ක්, රු.මිලියන 75 ක් හා රු.මිලියන 105 ක් පමණක් වෙන්කර තිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම හා භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තාව පරික්ෂා කිරීමේදී ඇස්තමේන්තුගත මුදලෙහි එකතුව රු.මිලියන 700 ක්වූ ව්‍යාපෘති 3 ක ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවීම හා එකතුව රු.මිලියන 153 ක ව්‍යාපෘති 2 ක කොන්ත්‍රාත් ක්‍රියාවලියේ පැවති දුර්වලතා හේතුවෙන් අදාල ගිවිසුම් අනුව ඉදිකිරීම් කාලය මාස 1 සිට මාස 10 ක් දක්වා කාල පරාසයන් තුල ප්‍රමාද වී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**--------------------------------**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රෝහල් ගාස්තු (Hospital Charges) ආදායම රු.2,100,844,980 ක් විය. නමුත් ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ගාස්තු හැර අනෙකුත් ගාස්තු තීරණය කිරීම සඳහා මිල කමිටුවක් පත්කර නොතිබුණු අතර අනෙකුත් ගාස්තු තීරණය වන ආකාරය හෝ පදනම පරිගණක මෘදුකාංග පද්ධතියට ඇතුළත්කර නොතිබුණි. එසේම ශල්‍යකර්ම, විවිධ පරීක්ෂණ වර්ග හා වෙනත් සේවාවන් සඳහා වූ රෝහල් ගාස්තු වරින්වර සංශෝධනය කර තිබුණද ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රෝහල්වලට අමු ආහාර සපයා ගැනීම හා රෝගීන්ට මෙන්ම කණිෂ්ඨ සේවකයින්ට ආහාර ලබාදීම සම්බන්ධයෙන් නිකුත්කර තිබුණු 2015 මැයි 28 දිනැති අංක 01 - 21/2015 දරන සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛයට අනුගත වන පරිදි මෙම රෝහල සඳහා සුදුසු විධිමත් ක්‍රමවේදයක් හා පරිපාටි ඇතුළත් උපදෙස් සංග්‍රහයක් පිළියෙලකර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. අමු ආහාර සපයා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සති ආහාර වැඩසටහන පිළියෙල කිරීමට ආයතන ප්‍රධානියා විසින් ආහාර කළමනාකරණ කමිටුවේ සහාය ලබාගැනීමට, පිළියෙල කරනු ලබන සති ආහාර වැඩසටහන අදාළ අංශ වෙත ලබාදීමට හා එයට අනුව අමු ආහාර සැපයීමේ මාසික අවශ්‍යතාවය පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) එක් එක් වාට්ටුවල වෛද්‍ය නිලධාරීන් විසින් සෑම රෝගියෙකුටම යෝග්‍ය ආහාර වටයක් ඇඳ ඉහපතෙහි සටහන් කිරීමට, රෝගීන්ගේ අමතර ආහාර පිළිබඳ අවශ්‍යතාවය අනුව ඇඳ ඉහපතෙහි සටහන්කර එය පෞද්ගලිකවම සහතික කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) නේවාසික රෝගීන් වෙනුවෙන් සෑම මාසයකම පළමුවනදා අළුත් ආහාර වට පත්‍රිකා පිළියෙල කිරීම, එක් එක් රෝගීන්ගේ ආහාර වට සාරාංශකර දවසට අවශ්‍ය ආහාර වට ප්‍රමාණය ගණනය කිරීම හා එදිනට සිටින රෝගීන් සංඛ්‍යාව සමග සැසඳීම, අමතර ආහාර (Extras) සටහන් පත්‍රිකාව සෑම දිනකම එකතු කිරීම හා එම ආහාර පිළිබඳ සාරාංශ ආකෘති පත්‍රයේ නියමිත තීරුවල සටහන් කිරීම මගින් දෛනිකව සැසඳීම සිදුකර නොතිබුණි.

(iv) පිසූ ආහාර ඉතිරිව අපතේ යාම පිළිබඳ පරීක්ෂාකර ඒ අනුව අමු ආහාර යම් ප්‍රතිශතයක් අඩුකර ඇණවුම් කිරීම සිදුකළ බවට තහවුරු ලේඛන පවත්වා නොතිබුණි.

(v) අහඹු ලෙස හදිසි පරීක්ෂණ පැවැත්වීම හා නිරීක්ෂණය වන අඩුපාඩු සම්බන්ධව පියවර ගැනීම සිදුකළ බවට ගොනුගත ලේඛන හා තොරතුරු නොතිබුණි.

(vi) පිසින ලද ආහාර ද්‍රව්‍ය බෙදීමට පෙර නිදර්ශන පෙන්වූ බවට, රෝහල් සේවකයින් ආහාර කාඩ්පත් ඉදිරිපත්කර ආහාර ලබාගන්නා බව පරීක්ෂාකළ බවට හා නියමිත ආහාර ප්‍රමාණය සේවකයන්ට ලබාදුන් බවට තහවුරු ලේඛන පවත්වා නොතිබුණි.

(vii) අවම පිරිවැයක් වැය වන ආකාරයට අමු ආහාර ද්‍රව්‍ය ඇණවුම් කිරීම, ලබාගැනීම, පිසීම හා බෙදාහැරීම පිළිබඳ කළමනාකරණය සඳහා ආහාර කළමනාකරණ කමිටුවක් සක්‍රීයව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(viii) ආහාර ද්‍රව්‍ය ඇණවුම් කිරීම, ගිණුම්ගත කිරීම හා ලේඛනගත කිරීම සහ පාලනය කිරීම සඳහා සුදුසු ආකෘතිපත් හඳුන්වා දී නොතිබුණි.

(ආ) 2016 නොවැම්බර් 30 දින රු.23,544,099 ක් වැයකර මිලදී ගෙන තිබුණු සායනික අපද්‍රව්‍ය දහන යන්ත්‍රය (Incinerator) මාසිකව රු.900,000 බැගින් ඉදිරි වර්ෂ 3 ක් සඳහා 2017 අගෝස්තු 01 දින සිට බාහිර ආයතනයක් වෙත කුලියට ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 774 රෙගුලාසියේ සඳහන් පරිදි ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව යන්ත්‍රය කුලියට ලබාදුන් ආයතනය තෝරාගෙන තිබුණි.

(ii) 2017 ජුලි 28 දින එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව, යන්ත්‍රය කුලියට ලබාගත් ආයතනය විසින් රෝහල වෙත මාසිකව රු.900,000 ක කුලී මුදලක් ගෙවිය යුතු වුවද, 2017 අගෝස්තු 01 දින සිට 2018 ජුනි 30 දින වන විටත් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි.

(iii) යන්ත්‍රය කොන්ත්‍රාත්කරු වෙත භාරදෙන අවස්ථාවේදී යන්ත්‍රයට ඇතුළත් කර තිබුණු භූමිතෙල් ලීටර් 3,644 ක පිරිවැය රු.174,902 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි.

(iv) රෝහල විසින් දිනකට ඉවතලන සායනික අපද්‍රව්‍ය ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 250 ත් කිලෝ ග්‍රෑම් 300 ත් අතර ප්‍රමාණයක් පමණක් වන බැවින් ඒ පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදුනොකර දෛනික ධාරිතාවය කිලෝ ග්‍රෑම් 1,200 ක් පමණ වන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. 2016 දෙසැම්බර් 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස 13 ක කාලය තුළ පුළුස්සා තිබුණු අපද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 184,187 ක් පමණක් වන බැවින් යන්ත්‍රයේ මුළු ධාරිතාවයෙන් සියයට 39 ක් පමණක් උපයෝජනය කර තිබුණි. වෙනත් පෞද්ගලික රෝහල් හා සෞඛ්‍ය ආයතනවලින් සායනික අපද්‍රව්‍ය ලබාගෙන දහනය කිරීමේ අපේක්ෂාවෙන් යන්ත්‍රය කුලියට දී තිබුණද, අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රෝහලේ ස්ථිර කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවාගැනීම්, උසස් කිරීම් හා ශ්‍රේණිගත කිරීම් සම්බන්ධ විධිමත් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි පිළියෙලකර අනුමත කරගැනීමට 2017 දෙසැම්බර් 31 වන විටත් කටයුතුකර නොතිබුණි.

(ආ) 2015 මැයි 22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, තොරතුරු තාක්ෂණ උපදේශකවරයෙකු (IT Consultant) කාර්ය පැවරුම් පදනම මත (Assignment Basis) 2015 ජුනි 08 දින සිට බඳවාගෙන මාසිකව රු.120,000 බැගින් 2017 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය තුළදී මුළු එකතුව රු.3,720,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) අදාළ පත්වීම් ලිපිය ප්‍රකාරව, සතියකට දින 3 ක් දිනකට පැය 2 ත් පැය 4 ත් අතර කාලයක් මෙම නිලධාරියා රෝහලේ සේවයට පැමිණ වැඩ කළ යුතු අතර, සේවයේ යෙදුනු බව හා අපේක්ෂිත සේවාව ඉටුකරගත් බව අධීක්ෂණ නිලධාරි විසින් සනාථ කර ගැනීමෙන් පසු මාසික දීමනාව ගෙවිය යුතු විය. එහෙත් සේවයට පැමිණි බව ලිඛිත සාක්ෂි මගින් තහවුරු කර නොගෙන හා අදාල සේවාව ඉටුකරගත් බවට සනාථ කර ගැනීමකින් තොරව දීමනා ගෙවා තිබුණි.

(ii) පත්වීම් ලිපිය ප්‍රකාරව, පවතින තොරතුරු තාක්ෂණ පද්ධතියෙහි අඩුපාඩු මඟහරවා එය වැඩි දියුණු කිරීමත්, ගිණුම්කරණය හා රෝහල් ගාස්තු බිල් කිරීම (Systolic and Accpac) පිළිබඳ පරිගණක මෘදුකාංගය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සහයවීමත්, එහිදී හඳුනාගන්නා ලද අඩුපාඩු හා ගැටළු සඳහා විසඳුම් පිළිබඳ වාර්තා කළමණාකරනයේ අවශ්‍යතාවය මත මාසිකව ලබාදීමත් සිදුකළ යුතු වුවද, එවැනි වාර්තා කිසිවක් ඉදිරිපත්කර තිබුණු බව අනාවරණය නොකෙරුණි.

(iii) මුල් පත්වීම මාස 6 කට ලබා දී තිබුණු අතර පසුව මාස 6 න් 6 ට සේවා කාලය දීර්ඝකර තිබුණද ගිණුම්කරණය හා බිල් කිරීම පිළිබඳ පරිගණක පද්ධතියේ අඩුපාඩු හඳුනාගත් බව හා ගැටළු සඳහා විසඳුම් ඉදිරිපත් කළ බව විගණනයේදී තහවුරු නොවීය.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

(අ) කොන්ත්‍රාත් වටිනාකම රු.53,833,744 ක් වූ විදුලි ඇඳසෝපාන (Bed Lift) 05 ක් මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව ඉකුත් වර්ෂයේදී පෞද්ගලික සමාගමකට පිරිනමා තිබුණු අතර කොන්ත්‍රාත් මුදලින් සියයට 83 ක් වූ රු.44,618,959 ක් 2017 පෙබරවාරි 17 දින ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) ක්‍රියාකාරී තත්වයේ පැවති පැරණි විදුලි සෝපාන 05 දෝෂ සහිත බවට අදහස් දක්වමින් ගලවා ඉවත්කර තිබුණු නමුත්, එසේ ගලවා ඉවත් කිරීම සඳහා රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 770 ප්‍රකාරව, පත්කරන ලද තාක්ෂණික නිලධාරියෙකුද ඇතුළත් සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශය ලබා ගෙන නොතිබුණි.

(ii) නව විදුලි සෝපානය මිලදී ගැනීමට අදාලව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව, නියමිත ආකෘති පත්‍රය තුළ ලංසු විවෘත කිරීමේ කටයුතු වාර්තාගත කළ යුතු වුවද, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රයක් පාවිච්චි කර නොතිබුණු අතර පවත්වා තිබුණු ලංසු විවෘත කිරීමේ වාර්තාව විවෘත කිරීමේ කමිටුවේ සාමාජිකයින් කිසිවෙකු විසින් අත්සන් කර නොතිබුණි.

(iii) ලංසු ලියවිලි වල ඇතුළත් පිරිවිතරවලට අනුව, නිෂ්පාදිත රටෙන් බාහිරව අදාළ සෝපාන උපයෝජනය කිරීම පිළිබඳ කාර්යසාධන සහතිකයක් හා පිළිගත් ස්වාධීන පරීක්ෂණ අධිකාරියකින් ලබාගත් මුළු යන්ත්‍රයටම අදාළ පරිදි පරීක්ෂණ සහතිකයක් ලංසුකරු විසින් ඉදිරිපත් කර නොතිබුණු නමුත් ඒ පිළිබඳව නොසලකා ලංසුකරු තෝරාගෙන තිබුණි.

(iv) තාක්ෂණික පිරිවිතරයන්හි සඳහන් පරිදි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ දිනයේ සිට දින 14 ක් ඇතුළත හා වැඩ ආරම්භ කිරීමට පෙර, තෝරාගත් ලංසුකරු විසින් Working Drawings විදුලි ඉංජිනේරුවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

(v) තාක්ෂණික පිරිවිතරයන්හි සඳහන් පරිදි විදුලි සෝපාන ද්‍රව්‍ය (Lift Materials), අදාළ නිෂ්පාදන ආයතනයේ කර්මාන්ත ශාලාවෙන් පිට කිරීමට පෙර නම්කරන ලද පරීක්ෂකවරුන් දෙදෙනෙකු වෙත යන්ත්‍ර උපාංගවල තත්ත්ව පරීක්ෂාව සඳහා (Quality Assuaring) කර්මාන්ත ශාලා පරීක්ෂණ සංචාරයක් (Factory Inspection Visit) ලබාදිය යුතු වුවද, සෝපාන ද්‍රව්‍ය (Lift Materials) රෝහලට ලැබී මාස 9 කට පසු එම සංචාරය ලබාදී තිබුණු බැවින් එවැනි සංචාරයකින් බලාපොරොත්තු වන අරමුණු ඉටු වී නොතිබුණි.

(vi) ලංසුකරු විසින් එකඟ වී තිබුණු පරිදි, ගැණුම් ඇණවුම නිකුත්කළ 2016 අගෝස්තු 08 දින සිට මාස 8 ක් ගත වන 2017 අප්‍රේල් 08 දින වන විට සෝපාන 05 ම සපයා සවිකළ යුතු වුවද ඉන් සෝපාන 03 ක් 2018 අගෝස්තු 31 දින වන විටත් ස්ථාපිතකර භාරදීමේ සහතිකය නිකුත්කර නොතිබුණි. තවද ප්‍රධාන පාලක කාමරය (Main Control Room) හා Lift Cabin අතර සන්නිවේදන (Interphone System) පහසුකම් සපයා නොතිබුණි. එසේම ලංසු කොන්දේසි තුළට ප්‍රමාද ගාස්තු පිළිබඳ කොන්දේසි ඇතුළත්කර නොතිබුණු බැවින් වර්ෂ 01 මාස 04 ක කාලයක් සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගත නොහැකිවී තිබුණි.

(vii) ලංසු ලේඛනවල සඳහන් අංක 14 දරන පිරිවිතරය ප්‍රකාරව, සෝපාන Cabin එක පළල මිලි මීටර්1,500 ක් විය යුතු වුවද, සපයා තිබුණු අංක 1, 2, 3 හා 4 දරන සෝපාන Cabin වල පළල මිලි මීටර් 1,200 ක් පමණක් වූ අතර අංක 5 දරන සෝපාන Cabin එකෙහි පළල මිලි මීටර් 1,400 ක් පමණක් වන බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම සත්‍ය මිනුම් ප්‍රමාණයන් විගණනයට සහතික කරදීමේ වගකීම රෝහලේ නඩත්තු ඉංජිනේරුවරයා විසින් පැහැරහැර තිබුණි.

(viii) සැපයුම්කරු විසින් වර්ෂ 2 ක ගාස්තු රහිත නඩත්තු කාලසීමාවක් ලබා දීමට එකඟ වී තිබුණද, මෙම යන්ත්‍ර ස්ථාපිත කළ පසු අවස්ථා කිහිපයකදී අක්‍රිය වී තිබීම හේතුවෙන් සැපයුම්කරු සේවා කටයුතු නිසි පරිදි සිදුකර නොතිබුණු බව තහවුරු විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.58,525,000 ක් වැයකර Digital Mammography යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු කැඳවීමේ ආරාධනයෙහි ජයග්‍රාහී ලංසුකරුට තිබිය යුතු, ඍජුවම සුදුසු බව තහවුරු කෙරෙන උපමාන හා සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා ඇතුළු ලංසු පිළියෙල කිරීමට ලංසුකරුට අවශ්‍යවන උචිත හා අදාළ මූලික තොරතුරු ඇතුළත් වන පරිදි ලංසු කැඳවීමේ ආරාධනාව ප්‍රසිද්ධ කළ යුතු වුවද, මෙම යන්ත්‍රය සැපයීම, සවිකිරීම හා නඩත්තු කිරීම යන සියළු කාර්යයන් වෙනුවට යන්ත්‍රය සැපයීම සඳහා පමණක් ලංසු කැඳවීමේ ආරාධනාව ප්‍රසිද්ධ කර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව, නියමිත ආකෘති පත්‍රය තුළ ලංසු විවෘත කිරීමේ කටයුතු වාර්තාගත කළ යුතු වුවද, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රයක් පාවිච්චිකර නොතිබුණු අතර පවත්වා තිබුණු ලංසු විවෘත කිරීමේ වාර්තාවට ලංසුකරුගේ හෝ නියෝජිතයින්ගේ අත්සන් ලබාගෙන නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 7.11.1 ඡේදය ප්‍රකාරව, තාක්ෂණික පිරිවිතරයන්ගේ ප්‍රධාන ප්‍රතිපාදනවලට සියළුම ලංසුකරුවන්ගේ අනුකූලතාවය දක්වන වගුවක් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළියෙල කර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) තෝරාගත් ලංසුකරු ඉදිරිපත්කර තිබුණු ලංසුව තුළ අදාළ නිලධාරීන් වෙත ලබාදිය යුතු දේශීය හා විදේශීය පුහුණුව සඳහා ලංසුවද ඇතුළත්කර තිබුණු නමුත්, 2017 පෙබරවාරි 10 දින යන්ත්‍රය රෝහලට භාර දී තිබුණද 2018 පෙබරවාරි 28 දින වන විටත් එම පුහුණුව ලබා දී නොතිබුණි. නමුත් සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(v) මෙම යන්ත්‍රයෙන් දිනකට පියයුරු පිළිකා පිළිබඳ පරීක්ෂණ 20 ක් පමණ සිදුකළ හැකි බව විගණනයේදී අනාවරණය වූ බැවින්, 2017 ජුනි 23 දින සිට 2018 පෙබරවාරි 28 දින දක්වා වූ මාස 8 ක කාලය තුළදී මාසයකදී වැඩ කරන දින ගණන 20 ක් ලෙස සළකා ගණනය කළහොත් පරීක්ෂණ 3,200 ක් පමණ සිදුකළ හැකි වුවද, එම කාලය තුළදී පරීක්ෂණ 449 ක් පමණක් සිදුකර තිබුණු බැවින්, යන්ත්‍රයේ උපයෝජනය එහි ධාරිතාවයෙන් සියයට 14 ක පමණ මට්ටමක පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.21,450,000 ක් වැයකර ලේ පිළිකා වර්ග හඳුනාගත හැකි Flow Cytometer යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) 2016 වර්ෂයේ මිලදී ගැනීමට අපේක්ෂිත වෛද්‍ය උපකරණ ලැයිස්තුව තුළ මේ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 8 ක් වුවද, වැයකර තිබුණු සත්‍ය වියදම රු.මිලියන 21.45 ක් වූ බැවින් ඇස්තමේන්තුව සියයට 168 කින් ඉක්මවා තිබුණි.

(ii) යන්ත්‍රයේ පිරිවිතරවලට අදාළ පොදු කොන්දේසි අංක (i) ප්‍රකාරව, ලංසුකරු විසින් සපයන යන්ත්‍රයේ වර්ගය හෝ මාදිලියට අදාළ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතු වුවද, එම සහතිකය ඉදිරිපත් කර නොතිබීම පිළිබඳව නොසලකා කොන්ත්‍රාත්තුව ප්‍රදානයකර තිබුණි.

(iii) ලංසු ඉදිරිපත්කර තිබුණු ලංසුකරුවන් දෙදෙනාම ලංසු ලේඛනවල සඳහන් තීරණාත්මක අවශ්‍යතා පිරිවිතරවලට එකඟ වූ යන්ත්‍ර වෙනුවෙන් ලංසු ඉදිරිපත් කර තිබුණද, මීට පෙර සපයා තිබුණු යන්ත්‍රයක් අකර්මන්‍ය වී ඇති බව දක්වමින් අවම මිල ඉදිරිපත් වූ ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණු නමුත්, එසේ අකර්මන්‍ය වීමක් සිදු වී නොතිබුණු බව විගණනයේදී අනාවරණය විය. එසේම යන්ත්‍ර පිරිවැය හා නඩත්තු පිරිවැය රු.10,250,646 කින් වැඩි මිලක් ඉදිරිපත් කල ලංසුකරුගේ පූර්ව චෝදනා පිළිබඳව සොයා බැලීමකින් තොරව ඔහුට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(iv) මෙම යන්ත්‍රය මගින් රෝග විනිශ්චය කරනු ලබන ලේ පිළිකා වර්ග විශාල වශයෙන් ශ්‍රී ලංකාව තුළ වාර්තා නොවන බව විගණනයේදී අනාවරණය වූ අතර, යන්ත්‍රය ස්ථාපිත කිරීමෙන් පසු 2017 මාර්තු 01 දින සිට 2018 අප්‍රේල් 30 දින දක්වා වූ මාස 14 ක කාලය තුළ පරීක්ෂණ 32 ක් පමණක් සිදුකර තිබුණු අතර ඇතැම් මාසවල පරීක්ෂණ කිසිවක් සිදුකර නොතිබුණි.

(v) මෙම යන්ත්‍රයේ භාවිතය සඳහා යොදා ගැනෙන පිරිවැය රු.4,608,158 ක් වූ Antibody Vials 42 ක් අදාළ අංශය සතු බව හා එමඟින් පරීක්ෂණ අවස්ථා 3,390 ක් කළ හැකි බව විගණනයේදී අනාවරණය වූ අතර එමඟින් මෙතෙක් සිදුකර ඇති පරීක්ෂණ ගණන අනුව යන්ත්‍රය ඌන උපයෝජිත තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය. එයින් පිරිවැය රු.4,319,196 ක් වූ Vials 38 ක් 2018 ජුනි 30 වන විටත් කල් ඉකුත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රෝහලට අවශ්‍ය මාළු සපයාගැනීමේ කොන්ත්‍රාත් ගිවිසුම 2017 ජනවාරි 04 දින අත්සන්කර තිබුණු අතර කොන්ත්‍රාත් වටිනාකම රු.25,950,240 ක් විය. පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ආ) හා (ඇ) මාර්ගෝපදේශ ප්‍රකාරව, ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂාව සඳහා ආරාධනාව සකස්කිරීම හා ඒවා සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම මෙන්ම පිරිවිතර ඇතුළු ලංසු ලේඛන කෙටුම්පත් සැකසීම හා ඒවා සමාලෝචනය කිරීම අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත්කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා නිශ්චිත ආකෘතියට අනුව වාර්තාගතකර නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් විසින් රහස්‍යභාවය හා අපක්ෂපාතීත්වය පිළිබඳ ප්‍රකාශයක් ලබාදී නොතිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, ආහාර සැපයීමේ සියළුම අවශ්‍යතාවයන්ට අදාළ මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙලකර නොතිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 (අ) සිට (ඇ) මාර්ගෝපදේශ ප්‍රකාරව, රෝහල් මණ්ඩලය විසින් සම්මත ලංසු කැඳවීමේ ලේඛන භාවිතාකර නොතිබුණු අතර ඒ වෙනුවට භාවිතා කරනු ලබන ලංසු ලේඛනවල යෝග්‍යතාවය පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව පරීක්ෂාකර අනුමතකර නොතිබුණි.

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු කැඳවීමේ ආරාධනයෙහි ජයග්‍රාහී ලංසුකරුට තිබිය යුතු, ඍජුවම සුදුසු බව තහවුරු කෙරෙන උපමාන හා සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා ඇතුළු ලංසු පිළියෙල කිරීමට ලංසුකරුට අවශ්‍යවන උචිත හා අදාළ මූලික තොරතුරු ඇතුළත් වන පරිදි ලංසු කැඳවීමේ ආරාධනාව පිළියෙලකර නොතිබුණි.

(vii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10 මාර්ගෝපදේශය ප්‍රකාරව, පශ්චාත් සුදුසුකම් පරීක්ෂාව සඳහා උපමාන ලංසු කැඳවීමේ ලේඛනවල පැහැදිලිව සඳහන් කළ යුතු වුවද, ඉකුත් වර්ෂ 3 ක සමාන සේවා සැපයීම, මූල්‍ය ප්‍රකාශන දත්ත, රෝහලේ සැපයුම් පිළිබඳ පෙර කාර්යසාධනය වැනි උපමාන ලංසු කැඳවීමේ ලේඛනවල ඇතුළත්කර නොතිබුණි.

(ඉ) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කරන ලද මාසික වටිනාකම රු.7,620,442 ක් වූ ආහාර ලැයිස්තුවට අමතරව, වටිනාකම රු. 2,605,056 ක් වූ අමතර ආහාර ද්‍රව්‍ය 82 ක් මිලදී ගැනීමට අදාලව තරඟකාරී ලංසු කැඳවීමෙන් තොරව 2016 සැප්තැම්බර් 27 දින මාළු හා අමු ආහාර ද්‍රව්‍ය සපයනු ලබන සැපයුම්කරු වෙතම

කොන්ත්‍රාත්තුව ප්‍රදානයකර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්රාත්තුවේ වාර්ෂික වටිනාකමින් සියයට 10 ක කාර්යසාධන ඇපකරයක් ලබාගෙන නොතිබුණු අතර මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත්තුකරු සමග විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී රු.130,380,000 ක් වැයකර Cardiac Catheterization Laboratory යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණු අතර ඒ පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රසම්පාදන කාලසටහනේ සඳහන් කාලපරිච්ඡේදය ඇතුළත ලංසු ඇගැයීම අවසන් කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.1.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, තාක්ෂණික ඇගැයීම් කමිටුවේ නිර්දේශ පිළිබඳව ප්‍රසම්පාදන කමිටුව සුපරීක්ෂාකාරීව සලකා බැලීම සිදුකර නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.5.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය පරිදි ජයග්‍රාහී ලංසුකරු තෝරාගත් බව හා ඊට එරෙහිව නියෝජන ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස අනෙක් ලංසුකරුවන්ට දැනුම්දීම සිදුකර නොතිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසුව ප්‍රතිග්‍රහණය කළ පසු වහාම විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් ලංසුකරුට නිකුත් කර නොතිබුණි.

(v) යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව නිලධාරීන් 5 දෙනෙකු වෙත යන්ත්‍රය නිෂ්පාදිත රට තුළ පුහුණුවක් ලබාදීමට වෙන්කර තිබුණු මුදල රු.3,030,000 ක් 2018 අප්‍රේල් 30 දින වන විට කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු නමුත් මෙම වාර්තාවේ දිනය වන විටත් එම පුහුණුව ලබා දී නොතිබුණි.

(vi) තෝරාගත් ලංසුකරු විසින් ඉදිරිපත්කර තිබුණු ලංසු ලියවිලි ප්‍රකාරව, 2017 මාර්තු 28 දින වන විට යන්ත්‍රය රෝහලට සපයා ස්ථාපිත කළ යුතු වුවද, ශ්‍රී ලංකා පරමාණු බලශක්ති නියාමන සභාවේ රෙගුලාසි ප්‍රකාරව, මෙම යන්ත්‍රය ස්ථාපිත කිරීමට යෝජිත පරිශ්‍රයේ බිත්ති ඝනත්වය මිලි මීටර් 300 ක් ලෙස සැකසීමට රෝහල විසින් කටයුතුකර නොතිබීම හේතුවෙන් යන්ත්‍රය ස්ථාපිත කිරීම 2017 අගෝස්තු 18 දක්වා මාස 04 කින් ප්‍රමාද වී තිබුණු අතර ඒ වෙනුවෙන් සැපයුම්කරු වෙත රු.478,980 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී රු.3,903,000 ක් වැය කර Containers 14 ක් කුලියට ගෙන තිබුණු නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකට එළඹී නොතිබුණි.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------------

උද්‍යාන සහ පවිත්‍ර කිරීමේ කාර්ය මණ්ඩලය සඳහා වැඩහළ හා කාර්යාලය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.87,019,408 ක බදු රහිත කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව 2016 නොවැම්බර් 09 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව, නියමිත ආකෘති පත්‍රය තුළ ලංසු විවෘත කිරීමේ කටයුතු වාර්තාගත කළ යුතු වුවද, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රයක් පාවිච්චිකර නොතිබුණි. පවත්වා තිබුණු ලංසු විවෘත කිරීමේ වාර්තාවට ලංසුකරුගේ නම පමණක් ඇතුළත් කර තිබුණු අතර ලංසු වටිනාකම, විකල්ප ලංසුවල මිළ ගණන් හා ලංසු ඇපකරයේ වටිනාකම ආදී තොරතුරු ඇතුළත් කර නොතිබුණි. තවද විවෘත කිරීමේ කමිටුවේ එක් සාමාජිකයෙකු පමණක් එම වාර්තාව අත්සන්කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 7.8 ඡේදය ප්‍රකාරව, ලැබී ඇති සියළුම ලංසු ප්‍රාරම්භක ලංසු ඇගැයීමකට භාජනය කළ යුතු වුවද, ලැබී තිබුණු ලංසු 10 ක් අතරින් අවම මිල සහිත ලංසු 4 ක් පමණක් ඇගැයීමට භාජනය කර තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.3 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු ඇගයීම සඳහා උපදේශකවරයෙකුගේ සේවය ලබාගන්නේ නම් එය තාක්ෂණික ඇගැයීම් කමිටුවේ අධීක්ෂණය හා මාර්ගෝපදේශකත්වය යටතේ සිදුකළ යුතු වුවද, උපදේශක ආයතනය විසින් සිදුකළ ඇගැයීම සඳහා තාක්ෂණික ඇගැයීම් කමිටුවේ අධීක්ෂණය හා මාර්ගෝපදේශකත්වය ලබා දී නොතිබුණි. උපදේශක ආයතනය විසින් ඉදිරිපත්කර තිබුණු ඇගැයීම් වාර්තාව පදනම් කර ගනිමින් තාක්ෂණික ඇගැයීම් කමිටුව සිය නිර්දේශය ඉදිරිපත්කර තිබුණි.

(ඈ) ලංසු ලියවිලිවල සඳහන් අංක 4.1 ( j ) දරන ලංසුකරුවන් සඳහා වූ උපදෙස් ප්‍රකාරව, තෝරා ගෙන තිබුණු 3 වන අවම මිල සහිත ලංසුකරු විසින් ඉදිරිපත් කළ යුතු අතැති වැඩ පිළිබඳ විස්තර හා දැනට ඇති වැඩ සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාගත හැකි බව සනාථ කිරීමේ ලියවිලි ඉදිරිපත්කර නොතිබුණි. එසේම ලංසුකරු ඉදිරිපත්කර තිබුණු පසුගිය වර්ෂ 5 ක මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලංසුකරුගේ මූල්‍ය තත්ත්වය යහපත් නොවන බව සනාථ වන නමුත් එම කරුණු පිළිබඳව නොසළකා තාක්ෂණික ඇගැයීම් කමිටුව මෙම ලංසුකරු තෝරා ගැනීම සඳහා නිර්දේශය ඉදිරිපත් කර තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත් ප්‍රදාන ලිපිය නිකුත් කිරීමත් සමගම දෙපාර්ශවය විසින් ගිවිසුමකට එළඹිය යුතු වුවද, කොන්ත්‍රාත් ප්‍රදානය සිදුකළ දින සිට දින 219 කට පසු ගිවිසුම අත්සන්කර තිබුණි.

(ඊ) ලංසු ලියවිලිවල සඳහන් අංක 4.14 දරන කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව, මාසික ප්‍රගති වාර්තා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත්කර නොතිබුණි. 2017 ජනවාරි 30 දින කොන්ත්‍රාත්තුව ආරම්භකර 2018 අප්‍රේල් 29 දින වන විට වැඩ නිමකිරීමට සැලසුම්කර තිබුණද, නියමිත පරිදි සේවකයින් හා ප්‍රමිතියෙන් යුතු අමුද්‍රව්‍ය කොන්ත්‍රාත්කරුගෙන් සපයා ගැනීමට අසමත්වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අපේක්ෂිත පරිදි ඉටුකර ගත නොහැකි වී තිබුණු අතර 2018 අප්‍රේල් 06 දින වන විට 1st Floor Slab මට්ටම දක්වා පමණක් වැඩ නිමකර තිබුණි.

(උ) ලංසු ලියවිලිවල සඳහන් අංක 14.5 දරන Contract Data ප්‍රකාරව, ගෙවිය හැකි අතුරු බිල්පතක අවම වටිනාකම රු.3,200,000 ක් වුවද, කොන්ත්‍රාත්කරු ඉදිරිපත්කර තිබුණු වටිනාකම රු.1,733,666 ක් හා රු.1,708,771 ක් වූ අතුරු බිල්පත් 2 ක් සඳහා ගෙවීම්කර තිබුණි.

## 6.2 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------

2017 ජූනි 09 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දුන් නියෝග ඉටුකර නොතිබුණු අවස්ථාවක් පහතින් දැක්වේ.

අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා ගණකාධිකාරී වැනි තනතුරු සඳහා අදාළ සුදුසුකම් පිළිබඳ අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීමෙන් පසු මාස 2 ක් ඇතුළත බඳවාගැනීම් පරිපාටිය සඳහා අනුමැතිය ලබාගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණද එම අනුමැතිය මෙම වාර්තාවේ දිනය වන විටත් ලබාගෙන නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මහාරෝගාශාලා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | විගණනය සඳහා ඉදිරිපත්කළ පරිගණක මුද්‍රිත ස්ථාවර වත්කම් ලේඛනයෙහි වර්ෂය තුළදී මිලදී ගනු ලැබූ ස්ථාවර වත්කම් පිළිබඳ තොරතුරු පමණක් ඇතුළත්කර තිබීම හා සියලුම ස්ථාවර වත්කම් භෞතිකව හඳුනාගෙන වටිනාකම් තක්සේරුකර ලේඛනගත කිරීමට කටයුතුකර නොතිබීම. |
| (ආ) තොග පාලනය | කල්ඉකුත් වූ තොග නිවැරදිව හඳුනාගෙන නොතිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | විධිමත් බඳවා ගැනීමේ පරිපාටි පිළියෙලකර අනුමතකර ගැනීමට කටයුතුකර නොතිබීම. |
| (ඈ) කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත් වැඩ ප්‍රමාදයකින් තොරව ඉටුකර ගැනීම සඳහා කටයුතු කර නොතිබීම හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතැම් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබීම. |
| (ඉ) මිලදී ගැනීම් පාලනය | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන වෛද්‍ය උපකරණ මිලදී ගැනීම හා ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව සැපයුම්කරුවන්ගේ සේවය ලබාගැනීමට කටයුතුකර නොතිබීම. |
| (ඊ) ගිණුම්කරණය හා පරිගණක මෘදුකාංග භාවිතය | (i) ජර්නල් සටහන් අංකය, ගණුදෙනු පිළිබඳ විස්තර හා ද්විත්ව සටහන පිළිබඳ විස්තර පරිගණක පද්ධතියේ ඇති ලෙජර් ගිණුම්වල සඳහන්කර නොතිබීම.<br>(ii) 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.24,125,003 ක් වූ ජර්නල් සටහන් 3 ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබීම.<br>(iii) 2017 දෙසැම්බර් 31 දිනට ණයගැති ගිණුම් 27 ක රු.27,373,267 ක් වූ බැර ශේෂ පැවතීම.<br>(iv) 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමි ගිණුම් 26 ක රු.21,567,527ක් වූ හර ශේෂ පැවතීම.<br>(v) රෝහල් ගාස්තු ආදායම ගිණුම්ගත කිරීම සඳහා ස්ථාපිත කර තිබුණු Systolic පරිගණක මෘදුකාංග පද්ධතිය තුළ, විවිධ වර්ගයන්හි ආදායම් ගිණුම්ගත කිරීම සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් කේත (Code) හඳුන්වා දී නොතිබීම, එක් ආදායම් ලෙජර් ගිණුම් කේතයක් (Code) යටතේ විවිධ වර්ගයන්හි ආදායම් ගිණුම්ගත කිරීම, එවැනි ලෙජර් ගිණුම් ශේෂ කිහිපයක එකතුව ගෙන ශේෂ පිරික්සුම පිළියෙලකර තිබීම හා එම පද්ධතිය තුළ, රෝහල් ගාස්තු ආපසු ගෙවීම් (Refund) ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබීම. |

(vi) ගෙවන වාට්ටුවල ප්‍රතිකාර ලද එක් එක් රෝගියාගෙන් අයකර තිබුණු රෝහල් ගාස්තු හා වෘත්තීය ගාස්තු වටිනාකම් වෙන වෙනම Systolic පරිගණක පද්ධතියෙන් ලබාගත නොහැකිවීම හා වෘත්තීය ගාස්තු ගිණුම් තැබීම පිළිබඳ ක්‍රමවේදයක් සහිත විධිමත් පාලන පද්ධතීන් හඳුන්වා දී නොතිබීම.

(vii) සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යවරු හා අනෙකුත් කාර්ය මණ්ඩලය වෙනුවෙන් රෝගීන්ගෙන් අයකර තිබුණු වෘත්තීය ගාස්තු රු.341,094,920 කින් රෝහලේ ආදායමට රු.511,644 ක් පමණක් බැරකර තිබීම සහ වෘත්තීය ගාස්තු අයකිරීම හා නැවත ගෙවීම සඳහා කාර්ය මණ්ඩලයක් යෙදවීමේ, පරිගණක මෘදුකාංග පද්ධතිය පවත්වාගෙන යාමේ හා බැංකු ගිණුම් පවත්වාගෙන යාමේ පිරිවැය හා වෙනත් පොදුකාර්ය පිරිවැය පිළිබඳ විශ්ලේෂණයක් සිදුකර නොතිබීම.

(ඨ) මූල්‍ය පාලනය

අවලංගු කරන චෙක්පත්වල මුහුණතෙහි "අවලංගු කලා" යන්න සටහන් නොකිරීම.

(ඩ) වාහන පාලනය

චක්‍රලේඛ විධිවිධාන පරිදි වාහන වල ඉන්ධන පරික්ෂාවක් සිදු නොකිරීම.